**“දොළොස් මහේ වාසි චක්‍රය” සඳහා නියමයන් හා කොන්දේසි - ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් 2026**

1. **“People’s Remittance- නිදහස් ප්‍රණාම” - එතෙර උදාන පුද්ගල බාලවයස්කාර විදේශ මුදල් ගිණුම - ප්‍රවර්ධන වැඩසටහන.**

**ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි**

**1.1 වැඩසටහනේ කාල සීමාව**

**“නිදහස් ප්‍රණාම”** ප්‍රවර්ධන වැඩසටහන 2026.02.01 සිට 2026.02.28 දක්වා පවත්වනු ලැබේ.

**1.2 යෝග්‍යතා නිර්ණායකයන්**

a) දැනටමත් විදේශයක සේවය කරමින් ශ්‍රී ලංකාවට ප්‍රේෂණ මඟින් මුදල් එවන දෙමාපියන් (මව සහ / හෝ පියා) ගේ දරුවන් මෙම වැඩසටහන සඳහා සුදුසුකම් ලබයි.

b) තෝරාගැනීම සඳහා නව **“එතෙර උදාන පුද්ගල විදේශ මුදල් - බාලවයස් ඉතුරුම් ගිණුමක්”** මහජන බැංකු ශාඛාවක විවෘත කළ යුතුය.

c) ත්‍යාගය සඳහා සුදුසුකම් ලැබීමට සෑම ශාඛාවකින්ම එක් පවුලක් අහඹු ලෙස තෝරා ගනු ලැබේ.

**1.3 තෝරා ගැනීමේ ක්‍රියා පිළිවෙත**

a) එක් ශාඛාවකින් සුදුසුකම් ලත් එක් පවුලක් අහඹු ලෙස තෝරා ගනු ලබයි.

b) මෙම තේරීම, වැඩසටහනේ කාල සීමාවා තුළ සිදුවන අතර, ත්‍යාගය සඳහා සුදුසුකම් ලැබීමට, නව “**එතෙර උදාන පුද්ගල විදේශ මුදල් - බාලවයස් ඉතුරුම් ගිණුමක්**” විවෘත කිරීම අවශ්‍ය වේ.

**1.4 ත්‍යාග විස්තර**

a) තෝරාගත් පවුල සඳහා **රුපියල් 5000/-ක් වටිනා මුදල් ත්‍යාගයක් හෝ මහජන බැංකු ත්‍යාග වවුචර** පිරිනමනු ලැබේ.

b) නව ගිණුම විවෘත කරන අවස්ථාවේදී ත්‍යාගය ප්‍රදානය කෙරේ.

**1.5 <u>පොදු කොන්දේසි</u>**

a) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

b) සුදුසුකම් ඇති පවුල් තෝරා ගැනීමේ **ශාඛා කළමණාකරුගේ** තීරණය අවසන් තීරණය වේ.

**c)** මෙම ප්‍රවර්ධන වැඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී මහජන **බැංකු කළමණාකාරීත්වයේ තීරණය අවසාන තීරණය වනු ඇත.**

## 2. <u>"වනිතා ප්‍රණාම" - ප්‍රේෂණ ප්‍රවර්ධන වැඩසටහන</u>

### <u>ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි</u>

**2.1** <u>වැඩසටහනේ කාල සීමාව</u>

2026.03.01 සිට 2026.03.31 දක්වා **"වනිතා ප්‍රණාම"** ප්‍රවර්ධන වැඩසටහන පවත්වනු ලැබේ.

**2.2** <u>යෝග්‍යතා නිර්ණායකයන්</u>

a) ප්‍රතිලාභියා මහජන බැංකුවේ **කාන්තා ගිණුම් හිමිකාරියක** විය යුතුය.

b) ශ්‍රමික ප්‍රේෂණ මහජන බැංකුවේ පවත්වාගෙන යනු ලබන **පුද්ගලික ගිණුමකට (වි.මු./රුපියල්)** සෘජුවම බැර කළ යුතුය.

**2.3** <u>ජයග්‍රාහකයන් තෝරා ගැනීම</u>

a) වැඩසටහනේ කාල සීමාව තුළ එනම් 2026.03.01 සිට 2026.03.31 දක්වා, මහජන බැංකු ගිණුම් වෙත ලැබුණු **ශ්‍රමික ප්‍රේෂණවල ඉහළම අගය මත පදනම්ව, ඉහළම ජයග්‍රාහකයින් 10 දෙනෙකු** තෝරා ගනු ලබන අතර, එහි ප්‍රතිලාභියා කාන්තාවක විය යුතුය.

b) **ප්‍රවර්ධන වැඩසටහන් කාලය ඇතුළත** (2026.03.01 සිට 2026.03.31 දක්වා) ප්‍රේෂණ ලැබිය යුතුය.

**2.4** <u>ත්‍යාග විස්තර</u>

**සෑම ජයග්‍රාහකයෙකුටම රුපියල් 50,000/-ක්** වටිනා මුදල් ත්‍යාග ලැබෙනු ඇත.

**2.5** <u>යෝග්‍යතාවයෙන් බැහැර කිරීම්</u>

a) ප්‍රේෂණ ලැබෙන **කාන්තා නොවන ගිණුම් හිමියන්** / බද්ධ ගිණුම්, මේ සඳහා සුදුසුකම් නොලබයි.

b) **මහජන බැංකු සේවකයින්** මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා සුදුසුකම් නොලබයි.

c) **බැංකු අණකර, සංචාරක චෙක්පත් සහ විදේශ මුදල් නෝට්ටු** වලින් ලද ප්‍රේෂණ මේ සඳහා සුදුසුකම් නොලබයි.

**2.6 <u>පොදු කොන්දේසි</u>**

a) **සතියේ සෑම දිනකම** (සෙනසුරාදා සහ ඉරිදා / බැංකු නිවාඩු දින ඇතුළුව) ගෙවනු ලබන ශ්‍රමික ප්‍රේෂණ සුදුසුකම් ලත් ප්‍රේෂණ ලෙස සලකා බලනු ලැබේ.

b) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

**c)** මෙම ප්‍රවර්ධන වඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී **මහජන බැංකු කළමණාකාරීත්වයේ තීරණය අවසාන තීරණය වනු ඇත.**

## 3. “කලින් අවුරුදු වාසි” - ප්‍රේෂණ ප්‍රවර්ධන වැඩසටහන

### ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි

**3.1** වැඩසටහනේ කාල සීමාව

**“කලින් අවුරුදු වාසි”** - වැඩසටහන 2026.01.01 සිට 2026.03.31 දක්වා ක්‍රියාත්මක වේ.

**3.2** යෝග්‍යතා නිර්ණායකයන්

ත්‍යාග දිනුම් ඇදීම සඳහා සුදුසුකම් ලබන්නේ ප්‍රවර්ධන වැඩසටහනේ කාලය තුළ **සෘජුවම මහජන බැංකු විදේශ මුදල් සහ ශ්‍රී ලංකා රුපියල් ගිණුම් (පුද්ගල ගිණුම් පමණයි)** වෙත ලැබෙන ශ්‍රමික ආමුඛ ප්‍රේෂණ පමණි.

**3.3** ත්‍යාග විස්තර

එක් අයෙකුට **රුපියල් 25,000/-** වටිනා අත්‍යාවශ්‍ය තෑගි මල්ලක් බැගින් **ජයග්‍රාහකයින් 50 දෙනෙකුට** ත්‍යාග ප්‍රදානය කෙරේ.

**3.4** තෝරා ගැනීමේ ක්‍රියා පිළිවෙත

2026.01.01 සිට 2026.03.31 දක්වා කාලය සඳහා ශ්‍රමික ප්‍රේෂණ ඔවුන්ගේ මහජන බැංකු ගිණුම් (වි.මු./රුපියල්) වෙත සෘජුවම ලබා ගන්නා ප්‍රතිලාභීන් ගෙන් දිනුම් ඇදීමකින් ජයග්‍රාහකයින් අහඹු ලෙස තෝරා ගන්නා අතර, සෑම ජයග්‍රාහකයෙකුටම රුපියල් 25,000/-ක් වටිනා අත්‍යාවශ්‍ය භාණ්ඩ මල්ලක් ත්‍යාග වශයෙන් පිරිනැමේ.

**3.5** ඉවත් කිරීම්

a) **බැංකු අණකර, සංචාරක චෙක්පත් සහ විදේශ මුදල් නෝට්ටු** වලින් ලද ප්‍රේෂණ මේ සඳහා සුදුසුකම් නොලබයි.

**3.6** යෝග්‍යතාවයෙන් බැහැර කිරීම

**මහජන බැංකු සේවකයින්** මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා සුදුසුකම් නොලබයි.

**3.7** පොදු කොන්දේසි

a) **සතියේ සෑම දිනකම** (සෙනසුරාදා සහ ඉරිදා / බැංකු නිවාඩු දින ඇතුළුව) ගෙවනු ලබන ශ්‍රමික ප්‍රේෂණ සුදුසුකම් ලත් ප්‍රේෂණ ලෙස සලකා බලනු ලැබේ.

b) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

**c)** මෙම ප්‍රවර්ධන වඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී මහජන බැංකු **කළමණාකාරීත්වයේ තීරණය** අවසාන **තීරණය වනු ඇත.**

## 4. "ශ්‍රම හරසර" - පුද්ගල විදේශ මුදල් ගිණුම් ප්‍රවර්ධන වැඩසටහන

**ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි**

**4.1** වැඩසටහනේ කාල සීමාව

මෙම "ශ්‍රම හරසර" වැඩසටහන 2026.05.01 සිට 2026.05.31 දක්වා පවත්වනු ලැබේ.

**4.2** යෝග්‍යතා නිර්ණායකයන්

a) **2026.05.01 සිට 2026.05.31 දක්වා** ප්‍රවර්ධන වැඩසටහනේ කාලය තුළ විවෘත කරන ලද **නව පුද්ගල විදේශ මුදල් ඉතුරුම් ගිණුම් පමණක්** මේ සඳහා සලකා බලනු ලැබේ.

b) තෝරාගත් ගනුදෙනුකරුවන් කිසිවිටෙකත් මහජන බැංකුව සමඟ පුද්ගල **විදේශ මුදල් ගිණුමක් නොතිබූ** විගමනික ශ්‍රමිකයන් විය යුතුය.

**4.3** ජයග්‍රාහකයන් තෝරා ගැනීම

මැයි මාසය තුළදී නව පුද්ගල විදේශ මුදල් ගිණුමක් කලින්ම විවෘත කරන සුදුසුකම් ලත් ගනුදෙනුකරුවන්ට රු. 5000/-ක් වටිනා මුදල් වවුචරයක් ලැබෙනු ඇත. ශාඛා කළමණාකරුවන් අහඹු ලෙස ත්‍යාගය ලැබීමට සුදුසු ජයග්‍රාහකයන් තෝරාගනු ඇත.

**4.4** ත්‍යාග විස්තර

ජයග්‍රහණය කරන සෑම ගනුදෙනුකරුවෙකුම **රුපියල් 5000/-ක්** මුදලින් හෝ මහජන බැංකු ත්‍යාග වවුචර ලබනු ඇත.

**4.5** ප්‍රේෂණ අවශ්‍යතාවයන්

ප්‍රේෂණ සාධාරණ කාල රාමුවක් තුළ **අළුතින් විවෘත කරන ලද ගිණුම**ට බැර කළ යුතුය.

**4.6** ඉවත් කිරීම්

දැනටමත් මහජන බැංකුව සමඟ පුද්ගල විදේශ මුදල් ගිණුමක් ඇති ගනුදෙනුකරුවන් මෙම වැඩසටහන සඳහා **සුදුසුකම් නොලබයි.**

**4.7 <u>යෝග්‍යතාවයෙන් බැහැර කිරීම</u>**

**මහජන බැංකු සේවකයින්** මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා සුදුසුකම් නොලබයි.

**4.8 <u>පොදු කොන්දේසි</u>**

a) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

**b)** මෙම ප්‍රවර්ධන වඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී **මහජන බැංකු කළමණාකාරීත්වයේ තීරණය අවසාන තීරණය වනු ඇත.**

**5. <u>"සංවත්සර ප්‍රණාම" - ප්‍රේෂණ ප්‍රවර්ධන වැඩසටහන</u>**

**<u>ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි</u>**

**5.1** <u>වැඩසටහනේ කාල සීමාව</u>

**"සංවත්සර ප්‍රණාම"** ප්‍රවර්ධන වැඩසටහන 2026.01.01 සිට 2026.06.30 දක්වා පවත්වනු ලැබේ.

**5.2** <u>යෝග්‍යතා නිර්ණායකයන්</u>

a) ප්‍රේෂණ මහජන බැංකු පුද්ගල ගිණුම් (වි.මු./රුපියල්) වෙත **සෘජුවම ලැබෙන ශ්‍රමික ආමුඛ ප්‍රේෂණ විය යුතුය.** (පුද්ගල ගිණුම් පමණයි).

b) වැඩසටහනේ කාල සීමාව තුළ (**2026.01.01** සිට **2026.06.30** දක්වා) ලැබෙන ප්‍රේෂණ පමණක් ත්‍යාග දිනුම් ඇදීම සඳහා සුදුසුකම් ලබයි.

**5.3** <u>ත්‍යාග විස්තර</u>

a) **2026.01.01** සිට **2026.06.30** දක්වා කාල සීමාව සඳහා **ශ්‍රමික ප්‍රේෂණ සෘජුවම ඔවුන්ගේ මහජන බැංකු ගිණුම් (වි.මු./රුපියල්) වෙත ලැබෙන ප්‍රතිලාභීන්ගෙන් දිනුම් ඇදීමකින් ජයග්‍රාහකයින් 65 දෙනෙකු** අහඹු ලෙස තෝරා ගනු ලැබේ.

**b) සෑම ජයග්‍රාහකයෙකුටම රුපියල් 15,000/-ක් වටිනා අත්‍යාවශ්‍ය භාණ්ඩ මල්ලක් ත්‍යාග වශයෙන් ප්‍රදානය කරනු ලැබේ.**

**5.4** <u>තෝරා ගැනීමේ ක්‍රියා පිළිවෙත</u>

a) ජයග්‍රාහකයින් තෝරා ගනු ලබන්නේ මහජන බැංකු පුද්ගල විදේශ මුදල් සහ ලංකා රුපියල් ගිණුම් වෙත සෘජුවම ලැබෙන ශ්‍රමික ආමුඛ ප්‍රේෂණ මත පදනම්වය.

b) සුදුසුකම් ලත් සහභාගිවන්නන්ගෙන් අහඹු ලෙස දිනුම් ඇදීමක් මඟින් ජයග්‍රාහකයින් තෝරා ගනු ලැබේ.

**5.5** <u>ඉවත් කිරීම්</u>

a) **බැංකු අණකර, සංචාරක චෙක්පත් සහ විදේශ මුදල් නෝට්ටු** වලින් ලද ප්‍රේෂණ මේ සඳහා සුදුසුකම් නොලබයි.

**5.6 <u>යෝග්‍යතාවයෙන් බැහැර කිරීම</u>**

**මහජන බැංකු සේවකයින්** මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා සුදුසුකම් නොලබයි.

**5.7 <u>පොදු කොන්දේසි</u>**

a) **සතියේ සෑම දිනකම** (සෙනසුරාදා සහ ඉරිදා / බැංකු නිවාඩු දින ඇතුළුව) ගෙවනු ලබන ශ්‍රමික ප්‍රේෂණ සුදුසුකම් ලත් ප්‍රේෂණ ලෙස සලකා බලනු ලැබේ.

b) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

**c)** මෙම ප්‍රවර්ධන වඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී මහජන බැංකු **කළමණාකාරීත්වයේ තීරණය අවසාන තීරණය වනු ඇත.**

## 6. "දූ දරු ප්‍රණාම" - ප්‍රේෂණ ප්‍රවර්ධන වැඩසටහන

### ක්‍රමවේදය / නියමයන් හා කොන්දේසි

### 6.1 වැඩසටහනේ කාල සීමාව

**"දූ දරු ප්‍රණාම"** ප්‍රවර්ධන වැඩසටහන **2026.10.01 සිට 2026.12.31** දක්වා පවත්වනු ලැබේ.

### 6.2 යෝග්‍යතා නිර්ණායකයන්

a) දිනුම් ඇදීමට සුදුසුකම් ලැබීම සඳහා නව **එතෙර උදාන පුද්ගල විදේශ මුදල් බාලවයස්කාර ගිණුමක්** වැඩසටහන ක්‍රියාත්මක වන කාලය තුළ මහජන බැංකු ශාඛාවක විවෘත කළ යුතුය.

b) අළුතින් විවෘත කරන ලද ගිණුම් වෙත, වැඩසටහන් කාල සීමාව තුළ **මාපිය හෝ භාරකරු ගේ** ගිණුමෙන් ආමුඛ ප්‍රේෂණ, අනුමත මුදල් මාරුකිරීම් හෝ නිත්‍ය නියෝග මත මුදල් මාරු කිරීම් ලැබිය යුතුය.

### 6.3 ත්‍යාග විස්තර

a) ජයග්‍රාහකයන් හට **රුපියල් 5000/-ක්** වටිනා පාසල් උපකරණ කට්ටල හිමිවේ.

### 6.4 තෝරා ගැනීමේ ක්‍රියා පිළිවෙත

a) වැඩසටහනේ කාල සීමාව තුළ **"එතෙර උදාන පුද්ගල විදේශ මුදල් බාලවයස්කාර ගිණුම්"** විවෘත කරන බාලවයස්කරුවන් වෙනුවෙන් දිනුම් ඇදීමකින් ජයග්‍රාහකයින් අහඹු ලෙස තෝරා ගනු ලැබේ.

b) දිනුම් ඇදීම සඳහා බාලවයස්කරුවන් තෝරා ගනු ලබන්නේ, ඔවුන්ගේ සුදුසුකම් මත පදනම්වය. ( එනම්, වැඩසටහනේ කාලය තුළ ප්‍රේෂණ හෝ මුදල් මාරු කිරීම් ලද ගිණුම් ය).

### 6.5 ත්‍යාග බෙදා හැරීම

සෑම ජයග්‍රාහකයෙකුටම **රුපියල් 5000/-ක්** වටිනා **පාසල් උපකරණ කට්ටල හිමිවේ.**

**6.6 <u>ප්‍රේෂණ අවශ්‍යතා</u>**

**ව්‍යාපාර ප්‍රවර්ධන කාලය තුළ (2026.10.01 – 2026.12.31) අළුතින් විවෘත කරන ලද ගිණුම් වෙත ප්‍රේෂණ / මුදල් මාරුකිරීම් - බැර කළ යුතුය.**

**6.7 <u>ඉවත් කිරීම්</u>**

a) අළුතින් විවෘත කරන ලද "එතෙර උදාන පුද්ගල විදේශ මුදල් බාලවයස්කාර ගිණුම්" පමණක් සුදුසුකම් ලබයි.

b) **අක්‍රිය** හෝ වැඩසටහනේ නිර්ණායකයන් සපුරා නොමැති ගිණුම් දිනුම් ඇදීම සඳහා සුදුසුකම් නොලබයි.

**6.8 <u>යෝග්‍යතාවයෙන් බැහැර කිරීම</u>**

**මහජන බැංකු සේවකයින්** මෙම වැඩසටහනට සහභාගී වීම සඳහා සුදුසුකම් නොලබයි.

**6.9 <u>පොදු කොන්දේසි</u>**

a) මෙම නියමයන්ට හා කොන්දේසි වලට අනුකූල නොවන ඕනෑම සහභාගිවන්නෙකු නුසුදුස්සෙකු කිරීමේ අයිතිය මහජන බැංකුව සතුවේ.

**b)** මෙම ප්‍රවර්ධන වඩසටහන සම්බන්ධයෙන් කිසියම් මතභේදයක් හෝ පැහැදිලි කිරීමක් හෝ ඇති වන අවස්ථාවකදී මහජන **බැංකු කළමණාකාරීත්වයේ තීරණය අවසාන තීරණය වනු ඇත.**